**වියදම් ශීර්ෂය - 267**

-------------------------

**මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

-----------------------------------

**විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය**

-----------------------------------------

**1.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්**

-----------------------------------------------

i. දිස්ත්‍රික්කයේ හා ප්‍රාදේශීයව වඩා යහපත් ආකාරයෙන් පුරවැසි ප්‍රඥාප්තිය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීමට.

ii. දිස්ත්‍රික්කයේ පරිපාලනය හා සංවර්ධනය සම්බන්ධීකරණය කිරීමේ ප්‍රධානියා බවට පත්වීමට.

iii. දිස්ත්‍රික් මට්ටමින් රාජ්‍ය සේවයේ ඵලදායීතාවය හා ගුණාත්මකබව ඉහල නැංවීම සඳහා රජයේ ප්‍රතිපත්ති හා පරිපාලන ව්‍යුහයන් වඩා යහපත් ක්‍රමයකට ක්‍රියාත්මක කිරීමට.

iv. විනිවිද භාවයෙන් යුත් අපක්ෂපාතී හා වගකිවයුතු රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීමට .

v. කාර්ය මණ්ඩල ධාරිතාවය ශක්තිමත් කිරීමට.

vi. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මූල්‍ය කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීමට.

vii. කාර්යක්ෂම හා ඵලදායී දිස්ත්‍රික් හා ප්‍රාදේශීය රාජ්‍ය පරිපාලන ක්‍රමයක් වැඩිදියුණු කිරීමට.

viii. දිස්ත්‍රික්කයේ පොදු ජනයාගේ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා කාර්යක්ෂම සේවා බෙදාහැරීමක් සැපයීමට.

ix. රජයේ සේවාවන්හි ඵලදායීතාවය හා ගුණාත්මක බව වැඩිදියුණු කිරීම සඳහා නවීන තොරතුරු තාක්ෂණය සමඟ සමස්ත සේවා හඳුන්වා දීමට.

x. ප්‍රධාන මූල්‍ය දර්ශක මැනීම සඳහා

xi. අමාත්‍යාංශ විසින් පවරන ලද කටයුතු ක්‍රියාත්මක කිරීමට.

xii. රාජ්‍ය උත්සව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් පැවැත්වීමට.

xiii. දිස්ත්‍රික් මට්ටමින් විදේශ අරමුදල් ව්‍යාපෘති සම්බන්ධීකරණය, අධීක්ෂණය හා සමාලෝචනය කිරීමට.

xiv. අවදානම් කළමනාකරණය හා ආපදාවන්ට මුහුණදීම සඳහා පූර්ව සැලසුම් කටයුතු පිළියෙල කිරීමට.

xv. සම්පත් පිළිබඳ විධිමත් උපයෝජනය තහවුරු කිරීමට.

**1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

(අ) මරිටයිම්පත්තු

(ආ) ඔඩ්ඩුසුඩාන්

(ඇ) මන්තායි නැගෙනහිර

(ඈ) තුනුක්කායි

(ඉ) පුතුකුඩුඉරිප්පු

**1.3 විගණන විෂය පථය**

මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා , සැසඳුම් ප්‍රකාශන , පොත්පත් , ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ජුලි 19 දින දිස්ත්‍රික් ලේකම් වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ , අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් , විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂාකිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ හා ගණන්දීමේ නිලධාරියාගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්ට හා වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන් සහ රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙනයාම , පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම , ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.5 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය වාර්තා හා පොත් අනුව, මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙම වාර්තාවේ (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ 1.6 සිට 1.10 දක්වා වූ ඡේදවල ඇතුළත් ප්‍රධාන විගණන නිරීක්ෂණ හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය වේ.

### (අ) විසර්ජන ගිණුම

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.160,677,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට එයින් රු.147,224,619 ක මුදලක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරි කිරීම් රු.13,452,381 ක් එනම් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 8.37 ක් විය. විස්තර පහත දැක්වේ.

| වියදම | 2012 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට උපයෝජනය | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | ඉතිරිය මුළු ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන | 109,450,000 | 113,177,000 | 104,754,211 | 8,422,789 | 7.44 |
| මූලධන | 47,500,000 | 47,500,000 | 42,470,408 | 5,029,592 | 10.59 |
| එකතුව | 156,950,000 | 160,677,000 | 147,224,619 | 13,452,381 | 8.37 |

**වර්ගීකරණ දෝෂ**

රු.1,951,321 ක් වූ මූලධන වියදම් අවස්ථා දහසයකදී සාවද්‍යව වර්ගීකරණය කර තිබූ අතර පුනරාවර්තන වියදම් විවිධ වැය විෂයයන් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඇ) **ආදායම් ගිණුම**

-----------------

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

-------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2012 වර්ෂය සඳහා ආදායම් සංකේත 07 ක් වෙනුවෙන් රු.මිලියන 2.06 ක ආදායමක් ඇස්තමේන්තුගත කර තිබුණු අතර රු.මිලියන 21.07 ක ආදායමක් රැස්කර ගෙන තිබුණි. ඇස්තමේන්තුගත ආදායමින්, ආදායම් සංකේත 3 ක් සඳහා කිසිදු ආදායමක් රැස්කර ගෙන නොතිබු අතර අනෙකුත් ආදායම් සංකේත වලින් රැස්කර ගෙන තිබු ආදායම සියයට 27 සිට සියයට 545 දක්වා පරාසයක් විය. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | (ඌන) / අධි රැස්කිරීම | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| 10-03-07-03 | - | 70,302 | 70,302 | - |
| 10-03-07-05 | 10,000 | 7,319 | (2,681) | 27 |
| 10-03-07-99 | - | 1,092 | 1,092 | |
| 20-02-01-01 | - | 191,535 | 191,535 | |
| 20-03-01-00 | 100,000 | - | (100,000) | - |
| 20-02-02-99 | 800,000 | 1,304,756 | 504,756 | 63 |
| 20-03-02-06 | - | 79,150 | 79,150 | |
| 20-03-02-07 | - | 181,000 | 181,000 | - |
| 20-03-02-13 | - | 603,160 | 603,160 | |
| 20-03-02-14 | - | 12,314,855 | 12,314,855 | |
| 20-03-02-99 | 250,000 | 33,717 | (216,283) | (86.5) |
| 20-03-03-00 | 100,000 | - | (100,000) | |
| 20-03-99-00 | 500,000 | 3,225,367 | 2,725,367 | 545 |
| 20-04-01-00 | - | 3,058,257 | 3,058,257 | |
| 20-06-02-00 | 300,000 | - | (300,000) | |
| | 2,060,000 | 21,070,510 | 18,852,210 | |

**(ඇ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලින් ලැබුණු ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශ 06 කින් හා දෙපාර්තමේන්තු 12 කින් පිළිවෙලින් රු.11,887,625 ක් හා රු.76,873,978 කින් සමන්විත එකතුව රු.88,761,603 ක් වූ ප්‍රතිපාදන ලැබී තිබුණි. එයින් පිළිවෙලින් රු.10,878,058 ක් හා රු.72,694,278 කින් සමන්විත රු.83,572,336 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.5,189,267 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි.

**(ඈ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

විෂය අංක 26701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 12,700,000 | 12,670,094 | 5,000,000 | 10,108,326 | 42,000,000 | 29,595,301 |

i. 2012 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය අනුව, 2012 දෙසැම්බර් 31 දිනට හිඟ හිට පැවති ශේෂ එකතුව රු.29,595,300 ක් වූ අතර එම හිඟ ශේෂ අයකර ගැනීම පිළිබඳ පසු විපරම් කටයුතු දුර්වල මට්ටමක විය.

ii. 2012 දෙසැම්බර් 31 දිනට සේවය අතහැර ගිය නිලධාරීන් 25 දෙනෙකුගෙන් අයවිය යුතු රු.17,664 ක ණය ශේෂය අයකර ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාල මාර්ගෝපදේශ අත්පොතේ 2.10.22 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

iii. සේවය හැර ගිය නිලධාරීන් දස දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.609,286 ක් වූ ආපදා හා සුනාමි ණය ශේෂයන් වර්ෂ 03 සිට 05 කට වැඩි කාලයක් අයකර ගැනීමෙන් තොරව පැවතුණි.

(ඉ) **පොදු තැන්පත් ගිණුම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ ශේෂ එකතුව රු.69,911,025 ක් වූ අතර විස්තර පහත දැක්වේ.

| **ගිණුම් අංකය** | **2012 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | රු. |
| 6003/0/0/43/0 | 69,911,025 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.

රා තැබැරුම් වලින් ලැබුණු රු.160,000 ක් වූ ඇප තැන්පතු 2008 අප්‍රේල් 10 දිනැති අංක 1544/17 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව සුරාබදු දෙපාර්තමේන්තුවේ තැන්පත් කිරීම වෙනුවට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තැන්පතු ගිණුමේ තැන්පත් කර තබුණි.

## 1.6 ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 1.6.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන් , දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානන් අමතන ලද රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට අවම වශයෙන් ඉදිරි වර්ෂ 3 ක් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වර්ෂය ආරම්භයේදී සංයුක්ත සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දක්වා පිළියෙල කර නොතිබුණි.

### 1.6.2 වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම

ඉහත 1.6.1 ඡේදයේ සඳහන් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට අනුකූලව 2010 වර්ෂය හා ඉදිරි වර්ෂ සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාර සැලැස්ම 2012 දෙසැම්බර් 31 දක්වා පිළියෙල කර නොතිබුණි.

**1.6.3 වාර්ෂික කාර්ය සාධන වාර්තා**

ඉහත 1.6.1 ඡේදයේ සඳහන් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය හා 2002 සැප්තැම්බර් 12 සහ 2004 පෙබරවාරි 20 දිනැති අංක 402 හා 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව මුදල් වර්ෂය අවසන්වී දින 150 ක් ඇතුළත දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පිළියෙල කළ යුත වාර්ෂික කාර්ය සාධන වාර්තාව විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළ කාර්ය සාධන වාර්තාව 2013 සැප්තැම්බර් 27 දක්වා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**1.6.4 අභ්‍යන්තර විගණනය**

සමාලෝචිත වර්ෂය තුළදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් අභ්‍යන්තර විගණනයන් සිදුකර නොතිබුණි. එසේම විගණන වැඩ සටහන විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**1.6.5 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය තුළදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

**1.7 වත්කම් කළමනාකරණය**

**(අ) නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්**

වත්කම් වර්ග 3 ක විෂයයන් 14 ක් වර්ෂ 1 සට 02 දක්වා කාලයක් නිෂ්කාර්යව හෝ ඌන උපයෝජිතව පැවති බව විගණන නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා මරිටයිම්පත්තු සහ ඕඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වර්ග 07 ක අතිරික්ත විෂයයන් හා වර්ග 12 ක ඌනතාවයන් පිළිබඳව හා 2012 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ වාර්තා මගින් කරන ලද නිර්දේශයන් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 1.8 අනුකූල නොවීම්

### (අ) නීති , රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණන නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති , රීති , හා රෙගුලාසිවල විධිවිධානයන්ට අනුකූල නොවීමේ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති , රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) චක්‍රලේඛ විධිවිධාන** | | |
| 1999 අප්‍රේල් 09 දිනැති අංක 1/99 | | - මුදල් හා ගබඩා පිළිබඳව කටයුතු කරන නිලධාරීන්ගෙන් ඇප තැන්පතු ලබාගෙන නොතිබුණි. |
| 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි/ඒ/අයි/2002/02 | | - පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| **(ආ) මුදල් රෙගුලාසි** | | |
| මුදල් රෙගුලාසි අංක 110 | | පාඩු පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| මුදල් රෙගුලාසි අංක 756 | | ග්‍රාමසේවා නිලධාරි කාර්යාල 102 ක් සම්බන්ධයෙන් භාණ්ඩ |

සමීක්ෂණ පවත්වා නොතිබුණි.

**1.9 පාඩු හා හානි**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙ හා ප්‍රාදේශීය ලේකම් කර්යාලවල සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂණවලදී පහත දැක්වෙන පාඩු හා හානි නිරීක්ෂණය විය.

| විෂයයන් | විෂයයන් සංඛ්‍යාව | වටිනාකම |
|---|---|---|
| | | රු. |
| පරිගණක | 02 | 220,000 |
| විදුලි උත්පාදන යන්ත්‍ර | 02 | 230,000 |
| ජායා පිටපත් යන්ත්‍ර | 01 | 59,950 |
| වාහන | 03 | 340,000 |
| | | 849,950 |

**1.10 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු**

2012 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි වේ.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i). | ජ්‍යෙෂ්ඨ මට්ටම | 84 | 73 | 11 |
| (ii). | තෘතියික මට්ටම | 12 | 00 | 22 |
| (iii). | ද්විතීයික මට්ටම | 284 | 153 | 131 |
| (iv). | ප්‍රාථමික මට්ටම | 46 | 27 | 19 |
| | එකතුව | 426 | 253 | 173 |

2013 අගෝස්තු 06 දිනට පැවති පුරප්පාඩු 173 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.